# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1891/10 - 2014 දෙසැම්බර් මස 02 වැනි අඟහරුවාදා - 2014.12.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/20/13/2008 නඩු අංකය : ඒ/3498 එදිරිව

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.02.27 දිනැති හා අංක 1799/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.02.18 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් තලංගම, කොස්වත්ත, කලපලුවාව පාර, අංක 115/ඩී හි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය (ඩී.ආර්.යූ.ජේ. වීරසේකර මයා වෙනුවෙන්) හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 04, තැ.පෙ. 1992, මෙල්බර්න් ඇවනිව්, අංක 27 හි පිහිටි සීමාසහිත පැලවත්ත ෂුගර් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.10.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

හේරත් යාපා,
කම්කරු කොමසාරිස්.

2014 නොවැම්බර් මස 26 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/20/13/2008

කාර්මික අධිකරණයේ දී ය.

අන්තර් සමාගම් සේවක සංගමය,
අංක : 115/ඩී, කලපලුවාව පාර,
කොස්වත්ත, තලංගම.
(ඩී.ආර්.යූ.ජේ. වීරසේකර වෙනුවෙන්)

*ඉල්ලුම්කරු*

සීමාසහිත පැලවත්ත ෂුගර් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්,
අංක : 27, මෙල්බර්න් ඇවනිව්,
තැ.පෙ. 1992,
කොළඹ 04.

*වගඋත්තරකරු*

ප්‍රදානය

කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2013.02.18 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

*02. පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :*

"සීමාසහිත පැලවත්ත සීනි කර්මාන්තායතනයේ P2 ශ්‍රේණියේ කාර්මික ශිල්පියෙකු ලෙස සේවය කරන ඩී. ආර්. යූ. ජේ. වීරසේකර මහතාට 2007.01.01 වෙනි දින සිට P1 ශ්‍රේණියට උසස්වීම් නොලැබීමෙන් ඔහුට යම් අගතියක් සිදු වුණිද ? එසේ වූයේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න වේ."

03. ඉහත කී සී/ස, පැලවත්ත සීනි කම්හල කීප වතාවක් බේරුම්කාර අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට අපොහොසත්වීම හේතු කොට ගෙන මෙම සමාගම ගැන කරුණු සොයා බැලීමෙන් පසු එම සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත xii කොටස යටතේ අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීමට තීරණය කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් කොළඹ 04, කාසල් පටුමග, අංක 02, එස්. ජේ. එම්.එස්. ඇසෝසියේට්ස්හි වරලත් ගණකාධිකාරීවරුන් වන පී. ඊ. ඒ. ජයවික්‍රම සහ පී. ජේ. ඩේවිඩ් ඈවරකරුවන් වශයෙන් පත් කර ඇති බැවි ඈවරකරුවන් වෙනුවෙන් බේරුම්කරණ නඩුවේ පෙනී සිටි නීතිඥ ටී. කේ. පුස්සේවෙල මහත්මිය බේරුම්කරණයට දන්වා ඇත.

04. බස්නාහිර පළාත්බද කොළඹදී පැවැත්වෙන (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) මහාධිකරණයේ අංක : HC/CIVIL/46/2012/CO යටතේ මේ නඩුව විභාග වේ.

05. ඉහත සඳහන් පසුබිම යටතේ ඩී. ආර්. යූ. වීරසේකර කම්කරු කොමසාරිස් විසින් මෙම ආරවුල සම්බන්ධයෙන් සකස් කරන ලද 2012.07.02 වෙනි දිනැති යොමුවේ සඳහන් ආරවුල සම්බන්ධයෙන් මාගේ ප්‍රදානය මෙසේය :-

*යොමුව අනුව :*

(i) 1986.03.01 වෙනි දින සිට පැලවත්ත සීනි සමාගමේ කාර්මිකයකු ලෙස සේවයට බැඳී පසුව P2 තනතුරට උසස් කර ඇත. (22)

(ii) ඔහු සමග සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ ඩී.ආර්.යූ.ජේ. වීරසේකර හැර අනෙකුත් සේවකයින් P1 තනතුරට උසස් කර ඇතත්, වීරසේකර P2 තනතුරේ සේවකයකු ලෙස විශ්‍රාම ගැනීමට සිදු විය. මේ අසාධාරණයට එරෙහිව මානව හිමිකම් කොමිෂන් සභාවේ බදුල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානයට පැමිණිලි කරන ලදී.

(iii) මානව හිමිකම් කොමිෂන් සභාවෙන්ද ඉල්ලුම්කරුට සහනයක් නොලැබුණු බැවින් අන්තර් සමාගම් සේවක සංගමයේ ආයතන ශාඛා ලේකම් විසින් මොණරාගල සහකාර කම්කරු කොමසාරිස් වෙතද ඉන් අනතුරුව කොළඹ මහලේකම් කාර්යාලයේ කම්කරු සබඳතා අංශයටද පැමිණිල්ලක් ගොනු කර ඇත.

(iv) කම්කරු සබඳතා අංශයේ නියෝජ්‍ය කම්කරු කොමසාරිස් පී. ඩබ්. කේ. ජයසිංහ මහත්මිය විසින් මෙම ප්‍රශ්නයට අදාළව 2010.08.20 වෙනි දින පරීක්ෂණයක් පවත්වා ඇතත්, එයින්ද ඉල්ලුම්කරුට සහනයක් ලැබී නැත. පැමිණිලිකරු හෝ ඔහුගේ වෘත්තීය සමිතිය ඊට පසු මේ ගැන කිසිවක් කර නැත.

ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් නිවැරදි කරුණු ඉදිරිපත් නොවීමත්, බේරුම්කරණය ඉදිරිපිටට සූදානම්ව නොපැමිණීමත් සීමාසහිත පැලවත්ත සීනි කර්මාන්තායතනය පරීක්ෂණයට ඉදිරිපත් නොවීමත් හේතු කොට ගෙන මෙම පරීක්ෂණය ආරම්භ කිරීමටත්, අවසන් කිරීමටත් නොහැකි විය. තවද ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති බොහොමයකට ගොනු කර ඇත්තේ සහතික නොකල ඡායා පිටපත් පමණි.

2013.08.07 වෙනි දින පරීක්ෂණය ආරම්භ කලාට පසුව ප්‍රථම වරට බේරුම්කරණය ඉදිරියට පැමිණි නීතිඥ අරුණි ගමගේ මෙනවිය දන්වා සිටියේ සීමාසහිත සීනි පෞද්ගලික සමාගමේ දේපල 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් යටතේ රජය විසින් පවරා ගෙන ඇති බවයි. නීතිඥවරිය තවදුරටත් බේරුම්කරණයට දන්වා සිටියේ එම ආයතනය ඈවර කිරීම සඳහා කොළඹ සිවිල් පළාත් බද මහා අධිකරණයේ නඩුවක් පවරා ඇති බවත්, ඈවරකරු "එස්. ජේ. එම්. එස්. ඇසෝසියේටඩ්, අංක : 02, කාසල් ලේන්, කොළඹ 04" බවත්ය.

ඈවරකාර සමාගම වෙනුවෙන් නීතිඥ ටී. කේ. පුස්සේවෙල මහත්මිය 2013.11.08 වෙනි දින බේරුම්කරණය ඉදිරියට පැමිණ එවැනිම විස්තරයක් බේරුම්කරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඔහුට ගෙවීමට යම් මුදලක් වෙතොත්,

එම මුදල නිගමනය කොට වානිජ මහා අධිකරණයේ අංක : 40/2012/CO යටතේ ගොනු කර ඇති නඩුවම ඉදිරිපත් කිරීමට ඉල්ලුම්කරුට අවස්ථාවක් ලබා දීමට බේරුම්කරණය විසින් තීරණය කරන ලදී. එහෙත් ඉල්ලුම්කරු විසින් බේරුම්කරණයට ඉදිරිපත් කර ඇති ලිපි ලේඛන නිවැරදි ලිපි ලේඛන ලෙස පිළිගැනීම අපහසුය.

පැමිණිලිකරුගේ නියෝජිත අන්තර් සමාගම් සේවක සංගමයේ නියෝජිත රෙජිනෝල්ඩ් මහතා විසින් පැමිණිලිකරු වෙනුවෙන් සාක්ෂි දීම සඳහා 2014.07.14 වෙනි දින බේරුම්කරණයට කම්කරු නිලධාරී සෙනරත් පුලිගේ නිමල් රෝසා කැඳවන ලදුව ඔහුගේ සාක්ෂියෙන් පහත සඳහන් කරුණු හෙළි වී ඇත :-

(i) රෝසා මහතා කම්කරු දෙපාර්තමේන්තුවේ පවත්වා ගෙන යන ලිපි ගොනුවක් ආශ්‍රිතව සාක්ෂි දී ඇත.

(ii) ඉල්ලුම්කරු පැලවත්ත සීනි කර්මාන්තායතයේ යාන්ත්‍රික ශිල්පියෙකු ලෙස 1986.03.01 වෙනි දින P ශ්‍රේණියේ සේවකයකු ලෙස සේවය කර ඇත.

(iii) A/08 ලේඛනය ඉල්ලුම්කරු වීරසේකර මහතා විසින් නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) වෙත යොමු කළ 2011.02.14 වෙනි දින දරන ලිපියයි. (2010.12.01 වෙනි දින සිට පී/01 ශ්‍රේණිය ලබා දී ඇත.)

(iv) A/09 ලිපිය ඉල්ලුම්කරු වීරසේකර මහතා විසින් කම්කරු කොමසාරිස් කාර්මික අංශය වෙත යොමු කරන ලද ලිපියකි.

(v) A/02 ලේඛනය නියෝජ්‍ය කම්කරු කොමසාරිස් එම්. එම්. ඩී. එන්. වටළියැද්ද මහතා විසින් කාර්මික සම්බන්ධතා අංශයට යොමු කරන ලද ලිපියකි.

මෙම ලිපියේ ඉල්ලීම උපන් ගෙයිම මිය ගොස් ඇත. වෘත්තීය සමිතිය මේ ගැන බුද්ධිමත්ව ක්‍රියා කර ඇති බවක් නොපෙනේ.

කම්කරු නිලධාරි නිමල් රෝසා මහතාගේ පැමිණිල්ලට වාසියක් සැලසෙන එකම ලේඛනය ඒ/16 දරන නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (කා.ස.) විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, පැලවත්ත ෂුගර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයි) ලිමිටඩ් පුද්ගලික තැපැල් මල්ල, බුත්තල වෙත යවන ලද 2010.10.20 වෙනි දිනැති ලිපියයි.

කම්කරු නිලධාරි නිමල් රෝසාගේ සාක්ෂිය තුළින් සලකුණු කරන ලද A/01 සිට A/13 දක්වා ඇති ලිපි ලේඛන ඡායා පිටපත් වන අතර, ඒවා ඔප්පු වී ඇති ලියවිලි නොවේ.

නිමල් රෝසා මහතා මගින් ඉදිරිපත් කරන ලද ලිපි ලේඛණ අතුරින් නියෝජ්‍ය කම්කරු කොමසාරිස් පී. ඩබ්. කේ. ජයසිංහ මහත්මිය විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, පැලවත්ත ෂුගර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයි) ලිමිටඩ් ආයතනය වෙත ජයසිංහ මහත්මිය විසින් යවන ලද ලිපියක පිටපතක් පමණි. මේ ගැන ඉදිරි කටයුතු කිරීමට ඉල්ලුම්කරු හෝ ඔහුගේ නියෝජිත වෘත්තීය සමිතිය උදාසීන ලෙස කටයුතු කර නැත.

ඉල්ලුම්කරුට 2007.01.01 වෙනි දිනට ශ්‍රේණි උසස්වීම් නොලැබීම නිසා ඔහුට ලැබිය යුතු දීමනා ඉල්ලුම්කරු තම වෘත්තීය සමිතිය මගින් බේරුම්කරණයට ඉදිරිපත් කරන ලද A/15 සහ A/15 - A අච්චාරුවක් වැනි අගක් මුලක් නැති ලියවිල්ලකි. එම ලියවිල්ල අත්සන් කර ඇත්තේ ඉල්ලුම්කරු විසිනි. එහෙත් එම ගෙවීම්වල අදාළ දින වකවානු සඳහන් කරන නැති අතර, එහි සඳහන් ගිණුම් විස්තර තහවුරු කිරීමට පිළිගත හැකි ලියවිලි ඉදිරිපත් කර නැත.

A/15 ලේඛනයේ EPF, ETF හිඟ මුදල වශයෙන් රු.21556/- ක් ලෙස සඳහන් කර ඇත. මෙම ගෙවීම් ව්‍යවස්ථාපිත ගෙවීම් නිසා අදාළ ලිපි ලේඛන විධිමත් ලෙස කම්කරු කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කොට ලබා ගත යුතු වන අතර, බේරුම්කරණයට එම ගෙවීම්වලට අත ගැසිය නොහැකිය. පාරිතෝෂිත මුදල වශයෙන් සඳහන් කර ඇති මුදල් අදාළ ලේඛන කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කොට ලබා ගැනීම ඉල්ලුම්කරුගේ යුතුකම වේ.

හිඟ අතිකාල දීමනා වශයෙන් ඉල්ලුම්කරු රු.96,000/- ක මුදලක් ඉල්ලා ඇති අතර, අදාළ ලියකියවිලි අදාළ ආයතනයට හෝ ආයතනවලට ඉදිරිපත් කොට එම අතිකාල දීමනා ලබා ගැනීමට ඉල්ලුම්කරුට පිළිවන.

ඉල්ලුම්කරුගේ ලිඛිත සැල කිරීමෙහි අස්ථානගත වී යැයි සඳහන් කර ඇති A/13 හි පිටපත් 02 ක්ම 76 සහ 77 පිටුවල ගොනු කර ඇති අතර, A/14 ලියවිල්ලේ පිටපතක් ඉදිරිපත් කරන බව 150 පිටුවේ සඳහන් වන එම ලේඛනය ඉදිරිපත් කර නැති බැව් පෙනේ.

සියළු කරුණු සැලකිල්ලට ගැනීමේදී ඉල්ලුම්කරුගේ ඉල්ලීම තහවුරු කිරීමට ඉල්ලුම්කරු හෝ ඔහුගේ වෘත්තීය සමිතිය විධිමත් ලෙස අදාළ ලියකියවිලි ඉදිරිපත් කර නොමැති බැවින් යොමුවේ සඳහන් පරිදි ඉල්ලුම්කරුට සහනයක් ලබා දීමට මට හැකියාවක් නැත.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමට කම්කරු කොමසාරිස් ජනරාල්වරයාට යවන්න.

ටී. පියසෝම,
බේරුම්කරු.

2014.10.28 වන දින,
කාර්මික අධිකරණයේ දී ය.

12 - 561

---

මගේ අංකය : IR/10/38/2009

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2010.11.19 දිනැති හා අංක 1680/36 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2010.11.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රාජගිරිය, වැලිකඩ, කෝට්ටේ පාර, අංක 985/14 හි පදිංචි එච්. එස්. ආර්. පෙරේරා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 34 හි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.11.11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

හේරත් යාපා,
කම්කරු කොමසාරිස්.

2014 නොවැම්බර් මස 26 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

එච්. එස්. ආර්. පෙරේරා,
අංක 985/14, කෝට්ටේ පාර,
වැලිකඩ,
රජගිරිය.

ඉල්ලුම්කරු

නඩු අංකය : ඒ/3357 හා

යොමු අංකය : IR/10/38/2009

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
අංක 34, ශ්‍රීමත් චිත්තප්පලම් ඒ
ගාඩිනර් මාවත,
කොළඹ 02.

අතර පවත්නා කාර්මික ආරවුල පිළිබඳ නියෝගය හා ප්‍රදානය

ගරු කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා එතුමාගේ අංක IR/10/38/2009 හා 2010.11.10 වැනි දිනැති ලිපියෙන් බේරුම්කරු වශයෙන් මා පත් කර ඇත.

1. ඉහත පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුලට හේතු වී ඇති කාරණය වශයෙන් ඉහත සඳහන් ආරවුලට අදාලව මා වෙත එවා ඇති කම්කරු කොමසාරිස්ගේ අංක IR/10/38/2009 හා 2010.09.07 දිනත් දරන ලිපියේ දක්වා ඇත්තේ, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 2007.05.30 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එහි සේවයෙන් ඉල්ලා අස් වූ එච්. එස්. ආර්. පෙරේරා මහතාට 2001.06.15 සිට 2006.12.31 වන දින දක්වා කාල සීමාව සඳහා ගෙවනු ලැබූ වැඩ බැලීමේ දීමනාව ඔහුගෙන් ආපසු අය කර ගැනීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම් එච්. එස්. ආර්. පෙරේරා මහතාට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව ද වේ යනුවෙනි.

2. මේ අනුව ඉහත කී කාර්මික ආරවුල සම්බන්ධයෙන් අදාල ප්‍රකාශ ගොනු කිරීමෙන් පසුව දෙපාර්ශවය අතර සමථයක් ඇති කිරීමට බේරුම්කරණය උත්සාහ කළ ද එවැනි සමථයක් ඇති කළ නොහැකි වූයෙන්, 2011.06.29 වන දින නඩු විභාගය ආරම්භ කරන ලදී.

3. මේ අනුව නඩු විභාගය 2011.06.29 දින ආරම්භ කළ අතර, ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් ඉල්ලුම්කරු ද, අධිකාරියේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරයකු වූ රණසිංහ ආරච්චිගේ නිමල් චන්ද්‍රසිරි යන අයවළුන් ද සාක්ෂි දුන් අතර, නඩු විභාගයේ දී A1 සිට A47 දක්වා ලේඛන ලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

4. අනතුරුව වග උත්තරකාර පාර්ශවය නඩුව ආරම්භ කරමින් අධිකාරියේ කළමණාකාරිනි මානව සම්පත් වනිගසූරිය ආරච්චිගේ නන්දාවතී රත්නායක යන අය පමණක් සාක්ෂිය දුන් අතර නඩු විභාගයේ දී වග උත්තරකාර අධිකාරිය වෙනුවෙන් R1 සිට R25 දක්වා වූ ලේඛන ලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

5. ඉන් අනතුරුව දෙපාර්ශව විසින් නඩු විභාගයේ දී ලකුණු කළ ලේඛන සමග දෙපාර්ශවයේ ලිඛිත සැලකිරීම් ගොනු කරන ලෙසට බේරුම්කරණය විසින් නියෝග කරන ලදුව ඒ අනුව එකී ලකුණු කළ ලේඛන සමග දෙපාර්ශවයේ ලිඛිත සැලකිරීම් ගොනු කර ඇත.

7. මෙම ආරවුලේ පසුබිම

මෙම ඉල්ලුම්කරු ගොනු කර ඇති ප්‍රකාශ සහ සාක්ෂි වාචික මගින් පහත දැක්වෙන කරුණු අනාවරණය කර ඇත. එනම්,

*a.* ඉල්ලුම්කරු 1981.10.01 වන දින VI (A) ශ්‍රේණියේ ගණකාධිකාරිවරයකු ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරියට සේවයට බැඳී ඇති බව සහ ඉන්පසු V(B), V (A) IV සහ III යන ශ්‍රේණිවලට උසස් වී ඇති බව

*b.* අනතුරුව 1999.06.01 දින 2(1) ශ්‍රේණියේ සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) වශයෙන් උසස්වීම් හිමිකර ගෙන ඇති බව

*c.* ඉහත සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) ලෙස සේවය කරන අතරතුර එකී තනතුරේ රාජකාරිවලට අතිරේකව 2001.06.15 දින සිට වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සැලසුම්/ප්‍රවාහන/සැපයුම්) ලෙස සභාපති අනු අත්සන් කර සාමාන්‍යාධිකාරිගේ 2001.06.18 දින දරන ලිපියෙන් පත්වීමක් ලබා දී ඇති බව (A12)

*d.* ඉහත කී වැඩ බැලීම වෙනුවෙන් ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 12-05-04 වගන්තිය අනුව රුපියල් හාරදහස් පන්සිය හැත්තෑ දෙකයි ශත පනහක (රු. 4,572.50) ක මාසික දීමනාවක් ගෙවන බව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන) විසින් 2001.08.21 දින දරන ලිපියෙන් ඉල්ලුම්කරුට දන්වා ඇති බව (A13)

*e.* අනතුරුව 2001.11.15 වන දින අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණයක් මත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සැළසුම්/ප්‍රවාහන/සැපයුම්) ලෙස ඉල්ලුම්කරු පත් කර ඇති බව (A14)

*f.* අනතුරුව එකී පත්වීම පාර්ලිමේන්තුව විසුරුවා හැරි කාලය තුළ සිදු කරන ලද්දක් බැවින් අධිකාරියේ 2002.01.19 දින දරන ලිපියෙන් ඉහත කී පත්වීම අවලංගු කර ඇතත්, නැවත වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සැළසුම්/ප්‍රවාහන/සැපයුම්) ලෙස පත් කර අඛණ්ඩව රාජකාරි කර ඇති බව (A15) මෙම කරුණ උත්තර ප්‍රකාශයේ 5 වන ඡේදය මගින් පිළිගෙන ඇති බව

*g.* නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන) ගේ 2004.09.30 දින දරන ලිපිය මගින් 2001.06.15 වන දින සිට ඉල්ලුම්කරුගේ වැඩ බැලීමේ පත්වීම රාජකාරි ඉටුකිරීමක් සේ සලකා 2001.06.15 දින සිට 2001.09.01 දක්වා රුපියල් තුන්දහස් හතලිස් අටයි ශත තිස්තුනක් (රු. 3,048.33) ක් ලෙස ද, 2001.09.01 දින සිට වැටුප් සංශෝධනය මත රුපියල් තුන්දහස් එකසිය දහසයයි ශත හැට (රු.3,116.60) ක් ලෙස ද සංශෝධනය කර ඇති බව (A16)

*h.* ඉහත කී 7 වන ඡේදයේ සඳහන් නියෝගය සම්බන්ධයෙන් ඉල්ලුම්කරු තම 2004.10.14 වන දින දරන ලිපිය (A17) මගින් විරෝධය දැක්වීම

*i.* 2004.11.12 දින දරන ලිපිය මගින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන) විසින් ගණකාධිකාරි ආයතනික ගෙවීම් වෙත දැන්වීමක් කරමින් මේ සම්බන්ධයෙන් තවදුරටත් කරුණු අධ්‍යයනය කර තීරණයක් දෙන තෙක් ඉල්ලුම්කරුගේ දීමනා සංශෝධනය කිරීම තාවකාලිකව අත්හිටුවීම (A18)

*j.* සියලුම නිලධාරීන්ගේ වැඩ බැලීමේ වැටුප් 2007.01.01 වන දින සිට තාවකාලිකව අත්හිටුවමින් මේ පිළිබඳව පසුව තීරණයක් ගන්නා බව (A21)

*k.* ඉල්ලුම්කරුගේ තනතුරේ වෙනසක් නොවීම නිසා 2006.12.31 වන දින දක්වා මාසිකව රු.4,572.50 ක් වැඩ බැලීමේ දීමනාවක් වශයෙන් වගඋත්තරකාර අධිකාරිය විසින් ගෙවා ඇති බව

*l.* මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් 2004.12.03 දින කම්කරු කොමසාරිස් වෙත අභියාචනයක් කිරීම සහ ඒ සම්බන්ධයෙන් කොළඹ දකුණ කම්කරු කාර්යාලයේ දී පරීක්ෂණයක් පැවති බව. (A19) සහ (A20)

*m.* අනතුරුව රුපියල් හාරදහස් පන්සිය හැත්තෑදෙකයි ශත පනහ (රු.4,572.50) ක වැඩ බැලීමේ දීමනාව 2006.12.31 දක්වා නොකඩවා දිගට ම ගෙවීම අනතුරුව 2006 වැටුප් සංශෝධනය මත 2007.01.01 දින සිට සියලු නිලධාරින්ට ගෙවූ වැඩ බැලීමේ දීමනා අත්හිටුවීම (A21)

*n.* ඉල්ලුම්කරු 2005.09.08 වන දින සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) ධූරයේ රාජකාරි ආවරණය කිරීමට සභාපති අත්සන් කළ 2005.09.06 දරන ලිපිය මගින් පත් කිරීම (A22)

*o.* 2007.05.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලුම්කරු විසින් සේවයෙන් ඉල්ලා අස්වීම තම 2007.04.17 දින දරන ලිපියෙන් දැන්වීම (A23)

*p.* සාමාන්‍යාධිකාරිගේ 2007.04.25 දින දරන ලිපිය මගින් ඉල්ලුම්කරුගේ වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) ලෙස ඉල්ලුම්කරුගේ සේවය ඉහළ මට්ටමක පැවතීම නිසා තවදුරටත් ඔහුගේ සේවය අවශ්‍ය බවත්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) ලෙස ස්ථිර පත්වීමක් ලබාදීමට සභාපතිතුමා තීරණය කර ඇති බවත්, ඒ අනුව ඉල්ලා අස්වීම පිළිගත නොහැකි බවත් ඉල්ලුම්කරුට දැන්වීම (A24)

*q.* ඉල්ලුම්කරු විසින් 2007.04.26 දින දරන ලිපිය මගින් වෙනත් රැකියා අවස්ථාවක් සඳහා එකඟ වී ඇති බැවින් 2007.05.17 වන දින සිට සේවයෙන් නිදහස් කරන ලෙස ඉල්ලීම (A25)

*r.* සාමාන්‍යාධිකාරිගේ 2007.05.09 දින දරන ලිපියෙන් 2007.05.30 වන දින තෙක් සේවය ලබා දෙන ලෙස ඉල්ලීම (A26)

*s.* ඉල්ලුම්කරු 2007.05.30 දින සේවයෙන් ඉල්ලා අස්වීම

*t.* සහකාර සාමාන්‍යාධිකාරි මානව සම්පත් විසින් 2007.06.04 දාතමින් යුත් ලිපිය මගින් ඉල්ලුම්කරුගෙන් පහත සඳහන් මුදල් ආපසු ගෙවන ලෙස දැන්වීම

| | |
|---|---|
| වැඩිපුර ගෙවූ වැටුප් | රු.20,975.07 |
| වැඩ බැලීමේ දීමනා සංශෝධනය කිරීම නිසා වැඩිපුර ගෙවූ මුදල | රු.68,194.34 |
| එකතුව | රු.89,169.41 |
| | (A27) (A21) |

*u.* ඉහත දැක්වූ වැඩිපුර ගෙවූ වැටුප වන රු.20,975.07 ක මුදල 1999 සහ 2001 වර්ෂයන් හි වැටුප් තල ගණනය කිරීමේ දී සිදු කළ අඩුපාඩු නිසා ගෙවීමක් මිස ඉල්ලුම්කරු විසින් ලබාගත් මුදලක් නොවන බව (A33)

*v.* මෙම මුදල් සම්බන්ධයෙන් 50% ක මුදලක් පාලන අංශයේ අදාල නිලධාරින්ගෙන් අයකර ගැනීමට අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කළත්, එවැනි මුදල් කිසිවක් අදාල නිලධාරීන්ගෙන් අයකරගෙන නොමැති බව (A46)

*w.* මේ අනුව ඉල්ලුම්කරුගේ සේවය ලබාගැනීමෙන් පසුව හා සේවයෙන් ඉවත් වූ පසුව ඉල්ලුම්කරුට පහත සඳහන් මුදල් ලැබිය යුතු බව

| | |
|---|---|
| (i) ගෙවන ලද වැටුප් වැඩිවීමේ දීමනාව වශයෙන් ආපසු අයකර ගත් මුදල | රු.111,594.66 |
| (ii) වැඩිපුර ගෙවූ වැටුප් | රු.20,975.07 |
| (iii) 2004.01.01 දින සිට 2006.12.31 වන දින දක්වා වැඩ බැලීමේ දීමනාව ලෙස ලැබිය යුතු මුදල | රු.46,590.00 |
| එකතුව | රු. 179,159.73 |

*x.* A28 - ආර්. එම්. නිමල් චන්ද්‍රසිරි යන අය II වන ශ්‍රේණියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුරට උසස් කිරීම (R15)

A29. නිමල් චන්ද්‍රසිරි යන අයට 2000.10.07 දින සිට වැඩ බැලීමේ වැටුප වන රු. 4,572.50 ක මුදලක් මාසිකව ගෙවීම සහ එකී මුදල් ඔහුගෙන් ආපසු අයකර ගෙන නොමැති බව (A29, A30, A31, A32)

8. මෙම ප්‍රශ්නගත ආරවුල සම්බන්ධයෙන් වගඋත්තරකාර අධිකාරිය සිය වාචික සාක්ෂි මගින්ද ලකුණු කළ ලේඛන මගින් ද, ලිඛිත සැලකිරීම් මගින් ද ප්‍රධාන වශයෙන් දක්වා ඇත්තේ පහත දැක්වෙන කරුණු වේ.

*a.* එච්. එස්. ආර්. පෙරේරා මහතාට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුරට අවශ්‍ය සුදුසුකම් නොමැති බව

*b.* නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන) විසින් එසේ සුදුසුකම් නොමැති බවට 2002.07.27 දාතමින් ඔහුගේ පෞද්ගලික ලිපිගොනුවෙන් සටහනක් තබා තිබීම (R23)

*c.* එසේම මෙවැනි අවස්ථාවක ඔහු පත්කළ යුත්තේ, රාජකාරි ඉටු කිරීම සඳහා පමණක් බව (කාර්ය වාර්තා 2013.09.03 පිටුව 8)

*d.* ප්‍රශ්නගත වැඩ බැලීමේ දීමනාව පෙරේරා මහතාගෙන් අයකර ගෙන ඇත්තේ, 2002.10.02 දිනැති අභ්‍යන්තර විගණන වාර්තාව (R23) අනුව විගණනයට භාජනය කර ඇත්තේ, 2002.09.16 දින වන විට වැඩ බලන නියෝජ්‍ය තනතුරුවල සේවය කරන නිලධාරීන් සම්බන්ධයෙන් පමණක් බව

*e.* එම අවස්ථාවේ නිමල් චන්ද්‍රසිරි මහතා වැඩ බැලීමේ පත්වීමක් නොව ස්ථිර පත්වීමක සිටි නිසා ඔහුගෙන් අය නොකළ බව

*f.* විගණන වාර්තාවේ සඳහන් වැඩ බැලූ සියළු දෙනාගෙන් වැඩිපුර ගෙවා ඇති වැඩ බැලීමේ දීමනා ආපසු අය කරගෙන ඇති බව

*g.* ඉල්ලුම්කරු රැකියාවෙන් ඉවත් වූ පසු එනම් 2007.05.30 දිනෙන් පසු එනම් 2007.06.04 දිනැති ලිපිය මගින් ඉල්ලුම්කරුගේ වැඩ බැලීමේ වැටුප් අයකර ගත් බව (කාර්ය වාර්තා 2013.09.03 පිටුව 9)

9. මෙම නඩුවේ දෙපාර්ශවයේ ප්‍රකාශත්, වාචික සාක්ෂිත්, ලකුණු කළ ලේඛනත්, ලිඛිත සැලකිරීම් ද යන සියලු කරුණු සමස්ථයක් ලෙස සලකා බැලීමේ දී බේරුම්කාර මා විසින් සලකා බැලිය යුත්තේ වගඋත්තරකාර අධිකාරිය විසින් 2007.05.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි එහි සේවයෙන් ඉල්ලා අස් වූ එච්. එස්. ආර්. පෙරේරා මහතාට 2001.06.15 දින සිට 2006.12.31 දින දක්වා කාල සීමාව සඳහා ගෙවනු ලැබූ වැඩ බැලීමේ දීමනාව ඔහුගෙන් ආපසු අයකර ගැනීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම් එච්. එස්. ආර්. පෙරේරා මහතාට කුමන සහනයක් හිමි විය යුතු ද යන්න වේ.

10. ඉහත දක්වා ඇති පරිදි දෙපාර්ශවයේ ප්‍රකාශත්, වාචික සාක්ෂිත්, ලකුණු කළ ලේඛනත් සහ ලිඛිත සැලකිරීම් ද සමස්ථයක් ලෙස සලකා බැලීමේ දී ඉහත කී 2001.06.15 සිට 2006.12.31 දින දක්වා කාල සීමාව සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් එච්. එස්. ආර්. පෙරේරා මහතාට ගෙවන ලද වැඩ බැලීමේ දීමනාව ආපසු අයකර ගැනීම හේතුවෙන් එකී එච්. එස්. ආර්. පෙරේරා මහතාට යම් අසාධාරණයක් සිදු වී ඇති බවට මම තීරණය කරමි.

11. මා එසේ තීරණය කිරීමට හේතු වූ කරුණු නම් :-

a. ඉහත කී එච්. එස්. ආර්. පෙරේරා මහතාගේ වාචික සාක්ෂිවලින් ද, ලකුණු කල ලේඛන මගින් ද මෙම බේරුම්කරණය සැහීමකට පත්වන අයුරින් පහත කරුනු සනාථ කර ඇත. එනම්, 1981.10.01 දින සිට VI A ශ්‍රේණියේ ගණකාධිකාරීවරයකු ලෙස වගඋත්තරකාර අධිකාරියේ සේවයට බැඳී ඇති අතර, ඉන් පසුව VB ශ්‍රේණියේ VA සහ IV වන ශ්‍රේණියට සහ III වන ශ්‍රේණියට උසස්කර ඇති අතර, 1999.06.01 දින සිට II ශ්‍රේණියේ පළමුවන පන්තියේ තනතුරක් වන සහකාර සාමාන්‍යාධිකාරී තනතුරට උසස් කර ඇත. අනතුරුව 2001.06.15 වන දින ඔහුගේ නිත්‍ය තනතුර වන සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරේ රාජකාරීවලට අමතරව වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම්/ප්‍රවාහන සහ සැපයුම්) තනතුරේ වැඩ බැලීමට 2001.06.18 දින සිට පත් කර ඇත. එකී ලිපිය අත්සන් කර ඇත්තේ, අධිකාරියේ සාමාන්‍යාධිකාරී වන අතර, සභාපතිවරයා විසින් අනුමත කර ඇත. අනතුරුව අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) විසින් අත්සන් කර නිකුත් කර ඇති 2001.08.21 දින දරන ලිපිය මගින් ඉහත කී එච්. එස්. ආර්. පෙරේරා මහතාට ආයතන සංග්‍රහයේ 12:5:4 පරිච්ඡේදයේ 7 උප වගන්තිය අනුව මසකට රු.4,572.50 ක වැඩ බැලීමේ දීමනාවක් ගෙවන බව දන්වා ඇත. එම ලිපිය ඉල්ලුම්කරු වෙනුවෙන් A13 වශයෙන් ලකුණු කර ඇත. අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2001.11.15 වන දින ඉහත කී පෙරේරා මහතා 2001.11.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම්/ප්‍රවාහන සහ සැපයුම්) ලෙස පත්කර ඇති අතර එකී පත්වීම පාර්ලිමේන්තුව විසුරුවා ඇති කාලය තුළ සිදුවූවක් නිසා 2002.01.19 වන දින දරන A15 ලෙස ලකුණු කළ ලිපිය මගින් අවලංගු කර ඇත. කෙසේ වුවද ඉල්ලුම්කාර පෙරේරා මහතා එකී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරේ වැඩ බැලීම අඛණ්ඩව සිදුකර ඇත. මේ බව වගඋත්තරකරුගේ පිළිතුරු ප්‍රකාශයේ පිළිගෙන ඇත. කෙසේ වුව ද නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පාලන විසින් 2004.09.30 දාතමින් ඉල්ලුම්කරු වෙත නිකුත් කර ඇති ලිපියේ ඔහුට 2001.06.15 දින සිට ලබා දී ඇති වැඩ බැලීමේ පත්වීම රාජකාරී පැවරීමක් ලෙස වෙනස් කර ඇති අතර, වැඩ බැලීමේ දීමනාව රු. 3,048.33 ක් ලෙස සංශෝධනය කර ඇත. එකී ලිපිය ඉල්ලුම්කරු වෙනුවෙන් A16 ලෙස සලකුණු කර ඇත.

*b.* එකී ලිපියෙන් කරන ලද සංශෝධන සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) වෙත යවා ඇති ඔහුගේ 2014.10.14 දිනැති ලිපිය මගින් තම විරුද්ධතාවය පළකර ඇති අතර, එකී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) ගේ 2004.11.12 දින දරන ලිපිය මගින් එකී සංශෝධනය නැවත දන්වන තෙක් අත්හිටුවා ඇත.

*c.* මේ අනුව ඉල්ලුම්කරු 2007.05.30 වන දින වගඋත්තරකාර අධිකාරියේ සේවයෙන් ඉල්ලා අස්වී ඇති අතර, 2006.12.31 දින දක්වා ඔවුන් රු.4,572.50 ක මුදලක් වැඩ බැලීමේ දීමනාව වශයෙන් ගෙවා ඇත.

*d.* ඉල්ලුම්කරු වෙනුවෙන් A21 වශයෙන් සලකුණු කරන ලද ලිපිය මගින් අධිකාරියේ වැඩ බැලීමේ දීමනා ගෙවන ලද සියලු නිලධාරීන්ගේ වැඩ බැලීමේ දීමනා 2007.01.01 සිට අත්හිටුවා ඇති අතර එකී ලිපිය ඉල්ලුම්කරු වෙනුවෙන් A21 වශයෙන් සලකුණු කර ඇත.

*e.* වගඋත්තරකාර අධිකාරියේ සභාපති විසින් අත්සන් කර ඇති 2005.09.06 දින දරන ලිපිය මගින් ඉල්ලුම්කරු 2005.09.08 දින සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් තනතුරේ රාජකාරී ආවරණය කිරීමට පත්කර ඇති අතර, එහිදී ද ඉහත කී පරිදි මසකට රු. 4,572.50 බැගින් වැඩ බැලීමේ දීමනාව ගෙවා ඇත. ඉල්ලුම්කරුගේ 2007.04.17 දින දරන ලිපියෙන් 2007.05.17 දින සිට අධිකාරියේ සේවයෙන් ඉල්ලා අස්වීමට ඉල්ලා ඇති අතර, එකී ලිපිය A23 වශයෙන් සලකුණු කර ඇත. ඉල්ලුම්කරුගේ සේවය ඉහළ තත්ත්වයේ පැවති හෙයින් ඔහුගේ ඉල්ලා අස්වීම අධිකාරිය විසින් භාරගෙන නොමැති අතර, ඔහු ස්ථිර වශයෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) වශයෙන්

පත් කරන බව දන්වා ඇත. එකී ලිපිය A24 වශයෙන් ලකුණු කර ඇත. වගඋත්තරකරුගේ ස්ථාවරය පරිදි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරට ඔහුට සුදුසුකම් නොතිබුණේ නම් මෙවැනි තීරණයක් ගැනීමට හැකියාවක් නොමැත.

*f.* පසුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම පරිදි 2007.05.30 වන දින සිට ඉල්ලුම්කරුගේ ඉල්ලා අස්වීම භාරගෙන ඇති අතර, වගඋත්තරකාර අධිකාරියේ සේවයෙන් ඉල්ලුම්කරු ඉල්ලා අස්වූ පසු එනම්, 2007.06.04 දාතමින් යුත් සහකාර සාමාන්‍යාධිකාරී මානව සම්පත් සංවර්ධන කළමනාකරණ විසින් එවා ඇති ලිපිය මගින් ඉල්ලුම්කරුට ගෙවා ඇති සියලු වැඩ බැලීමේ දීමනා වැටුප් වැඩිපුර ගෙවීමක් ලෙසත්, එම මුදල් ආපසු අධිකාරිය වෙත ගෙවන ලෙස දන්වා ඇත. එකී ලිපිය A27 ලෙස ලකුණු කර ඇත. ඒ අනුව ඉහත කී A27 දරන ලිපිය ඉල්ලුම්කරුට ලැබී ඇත්තේ, අධිකාරියේ සේවයෙන් ඉවත් වී මාසයකුත්, දින 20 ක කාලයක් ඉකුත්වීමෙන් බැවින් මේ සම්බන්ධයෙන් ඉල්ලුම්කරු කම්කරු කොමසාරිස්වරයා වෙත දැනුම් දීමෙන් අනතුරුව ඔහු විසින් 2007 මැයි මස වැටුප සහ වැඩ බැලීමේ දීමනාවල හිඟ වැටුප් ද, 2006.01.01 දින සිට සංශෝධිත වැටුප ද ගෙවන ලෙස කම්කරු කොමසාරිස්ගේ BS/CC/A/4/23/7 හා 2008.01.07 දින දරන ලිපිය මගින් අධිකාරියට දන්වා ඇතත් එය ක්‍රියාත්මක නොවීම නිසා මෙම ආරවුල බේරුම්කරණයට යොමු කර ඇත.

*g.* මෙම නිලධාරියාට ඉහත කී යොමුවේ දක්වා ඇති පරිදි 2001.06.15 දින සිට 2006.12.31 දින දක්වා කාල සීමාව සඳහා ගෙවනු ලැබූ වැඩ බැලීමේ දීමනාව වගඋත්තරකාර අධිකාරිය විසින් ඔහුගේ අවසන් ගෙවීම්වලින් ආපසු අය කරගෙන ඇත. මෙය ඔහුගේ සේවාව ලබා ගැනීමෙන් පසු සිදු කරන ලද අසාධාරණයක් ලෙස මෙම බේරුම්කරණය තීරණය කරයි.

*h.* එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ඉල්ලුම්කරුට සමාන හෝ අඩු සුදුසුකම් තිබූ ගණකාධිකාරී චන්ද්‍රසිරි යන අයට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් ඔහුට රු.4,572.50 ක මුදලක් ගෙවා ඇති අතර, එම මුදල ඔහුගෙන් අය නොකර තිබීම ය. ඒ බව නිමල් චන්ද්‍රසිරි යන අය තම සාක්ෂිවල දී ප්‍රකාශ කර ඇත. ඔහු මෙසේ ප්‍රකාශ කර ඇත.

ප්‍ර : ඔබ කුමන කාලයක් සිටිය ද මෙම තනතුරේ?

උ : 2007 වෙනකල්.

ප්‍ර : ඔබට ගෙවීම් කළා ද?

උ : සේවය අවසන් වෙනකල් විශ්‍රාම යනකල්ම ගෙව්වා.

ප්‍ර : තමන්ගෙන් වැඩ බැලීමේ වැටුප් අඩුකර ගත්ත ද?

උ : නැහැ
(සාක්ෂි සටහන් 2013.01.08 පිටුව 9)

මේ සම්බන්ධයෙන් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඉල්ලුම්කරු මෙසේ ප්‍රකාශ කර ඇත.

ප්‍ර : මා තමාට යෝජනා කර සිටිනවා තමාට නිසි සුදුසුකමක් නොමැති නිසා මෙම වැඩ බැලීමේ දීමනාව සම්බන්ධයෙන් ගෙවූ මුදල අධිකාරියෙන් අයකර ගැනීම ඉතාමත් සාධාරණයි කියා.

උ : මම එයට එකඟවන්නේ නැහැ. මීට පෙර ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) ලෙස කටයුතු කළ චන්ද්‍රසිරි මහතාට මා හා සමාන හෝ මට වඩා අඩු සුදුසුකම් තිබිය දී ඔහු මෙම තනතුරට පත් කර වැඩ බැලීමේ දීමනාව වශයෙන් රු. 4572.50ක් ගෙවා තිබෙනවා. අවුරුදු 2 කට ආසන්න කාලයක් නමුත් ඒ මුදල් අයකරගෙන නෑ මා දන්නා තරමින්

(සාක්ෂි සටහන් 2012.06.18 පිටුව 10, 11)

මෙම බේරුම්කරනය ඉදිරියේ අධිකාරිය වෙනුවෙන් සාක්ෂි දුන් මානව සම්පත් කළමනාකාරිනි නන්දාවතී රත්නායක යන අයගේ සාක්ෂිවල දී මෙසේ ප්‍රකාශ කර ඇත.

ප්‍ර : වගඋත්තරකාර අධිකාරියේ අනුමත තනතුරක් ද?

උ : අනුමත තනතුරක් නොවේ.

ප්‍ර : එසේනම් කෙසේ ද එම සැපයුම් ප්‍රවාහන තනතුර ඉල්ලුම්කරුට ලබා දී තිබෙන්නේ?

උ : අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී තිබෙනවා.

ප්‍ර : සාක්ෂිකාරිය පැහැදිලි කරන පුරප්පාඩු වී තිබෙන තනතුරකට දැනට වැඩ බැලීමේ පිහිටුවන නිලධාරියාට සපුරා තිබිය යුතු සුදුසුකම් ?

උ : වැඩ බැලීමට පත්කිරීමට නම් ආයතන සංග්‍රහය අනුව සුදුසුකම් සපුරා තිබිය යුතුයි.

(සාක්ෂි සටහන් 2013.07.29 පිටුව 5)

මෙම තත්ත්වය බේරුම්කරනයට පිළිගත නොහැක්කේ සාක්ෂිකාරිය ප්‍රකාශ කරන අන්දමට ඉල්ලුම්කරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇත්තේ, අධිකාරියේ අනුමත තනතුරකට නොවන බැවිනි.

ඉහත සාක්ෂිකාරිය 2013.09.03 වන දින පිටුව 2 සාක්ෂිදීමේ දී මෙසේ ද ප්‍රකාශ කර ඇත.

ප්‍ර : මෙම නඩුවේ ඉල්ලුම්කරු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සැලසුම් ප්‍රවාහන හා සැපයුම් යන තනතුරට පත් කිරීමට ඔහුට තිබූ සුදුසුකම් මොනවා ද?

උ ඃ ලන්ඩන් පිරිවැය කළමණාකාරිත්ව ආයතනයේ ආවසරික සහතිකය හා නෙදර්ලන්ත මූල්‍ය කළමනාකාර ඩිප්ලෝමාව

ප්‍ර ඃ ඒ අනුව මේ නඩුවේ ඉල්ලුම්කරුට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි සැපයුම්, සැලසුම් සහ ප්‍රවාහන යන තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් ඔහුට තිබුණා ද?

උ ඃ අවශ්‍ය සුදුසුකම් තිබුනේ නෑ. බඳවා ගැනීමේ පටිපාටිය අනුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තනතුර සඳහා උපාධිය සමග සේවා පළපුරුද්ද සැපිරිය යුතුයි. මෙම ඉල්ලුම්කරු ලන්ඩන් පිරිවැය කළමනාකාරිත්ව ආයතනයේ ආවසරික විභාගය පමණයි සමත්ව තිබුණේ. උපාධියක් ලබා තිබුනේ නැහැ. එම නිසා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තනතුරට සුදුසුකම් තිබුණේ නැහැ.

කරුණු මෙසේ වුව ද මෙම අධිකාරිය විසින් ඉල්ලුම්කරු තම ඉල්ලා අස්වීම ලබා දුන් පසු ඔහුට ස්ථිර වශයෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුර ලබා දීමට සභාපතිතුමා තීරණය කර ඇති බව ඉල්ලුම්කරුට දන්වා ඇති බැවින් (A24 දරන ලිපිය මගින්) ඉහත කී සාක්ෂිකාරියගේ එකී ස්ථාවරය මෙම බේරුම්කරණයට පිළිගත නොහැක.

12. තීන්දුව හා ප්‍රදානය

මේ අනුව වගඋත්තරකාර අධිකාරිය විසින් ඉහත කී ඉල්ලුම්කරුගෙන් 2001.06.15 දින සිට 2006.12.31 දින දක්වා වැඩ බැලීමේ දීමනාව වශයෙන් ගෙවන ලදුව පසුව ඔහුගේ වැටුපෙන් ඔහු සේවයෙන් ඉල්ලා අස්වීමේ දී ආපසු අය කරගෙන ඇති රු.68,194.34 ක මුදල (R21 අනුව) ආපසු ඉල්ලුම්කරුට වගඋත්තරකාර අධිකාරිය විසින් ගෙවිය යුතු බවට මෙයින් නියෝග කරමි.

තවද ඉහත කී මුදල ඉල්ලුම්කරුට ලබාගත හැකිවන පරිදි මෙම නියෝගය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට මසක් ඇතුළත සහකාර කම්කරු කොමසාරිස් (දකුණු කොළඹ) වෙත තැන්පත් කළ යුතු බවට ද, එසේ තැන්පත් කිරීමෙන් පසු ඉහත කී මුදල මෙම නඩුවේ ඉල්ලුම්කරුට ලබා ගත හැකි බව ද සටහන් කරමි.

ඉල්ලුම්කරු තම පළමු ප්‍රකාශය මගින් 2006.01.01 දින සිට 2006.12.31 වන දින දක්වා වැඩ බැලීමේ දීමනාව ලෙස ලැබිය යුතු මුදල වශයෙන් රු. 46,590 ක මුදලක් දක්වා ඇතත් ඒ පිළිබඳ සාක්ෂි දී තහවුරු කර නොමැති බැවින් සහ අදාල යොමුවට 2006.12.31 දින දක්වා කාලය ඇතුළත් වී ඇති බැවින් එකී මුදල සම්බන්ධයෙන් ප්‍රදානයක් ලබා නොදීමට තීරණය කරමි.

මෙය සාධාරණ සහ යුක්ති සහගත තීන්දුවක් හා ප්‍රදානයක් බවට මම සලකමි.

පී. දනන්සූරිය,
බේරුම්කරු.

වර්ෂ 2014 ක් වූ නොවැම්බර් මස 11 වන දින දී ය.

12 - 562